# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන)

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා විසින් 2013 ඔක්තෝබර් මස 22 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 ඔක්තෝබර් මස 07 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[273 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 21.00 යි. තැපැල් ගාස්තුව : රු. 15.00 යි.

2—PL 007684—1,000 (2013/10)

එල්.ඩී.—ඕ. 1/2011.

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මෙම පනත 2013 අංක දරන ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ දීර්ඝ නාමයේ "ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය සහ ජලජ සම්පත් කළමනාකරණය කිරීම, විධිමත් කිරීම, සංරක්ෂණය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස සහ (212 වන අධිකාරය වූ) ධීවර ආඥාපනත," යන වචන වෙනුවට "ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය සහ ජලජ සම්පත් කළමනාකරණය කිරීම, විධිමත් කිරීම, සංරක්ෂණය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඇතැම් ජාත්‍යන්තර සහ කලාපීය ධීවර ගිවිසුම් යටතේ ශ්‍රී ලංකාවේ බැඳීම්වලට බලාත්මක භාවයක් ලබාදීම පිණිස ද; (212 වන අධිකාරය වූ) ධීවර ආඥාපනත," යන වචන ආදේශ කිරීමෙන් එහි දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ. 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (ආ), (ඇ), (ඈ) සහ (ඉ) ඡේද ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන්:—

"(ආ) අධ්‍යක්ෂ-ජනරාල්වරයා;

(ඇ) ධීවර විෂයය පවරා ඇති සෑම පළාතකම අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා;

(ඈ) 1999 අංක 36 දරන ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය පනත යටතේ පිහිටුවන ලද ජාතික ධීවර සහ නාවික ඉංජිනේරු ආයතන සභාවේ සභාපතිවරයා;

2—PL 007593—525 (2013/09)

(ඉ) සභාවේ ලේකම්වරයා විය යුතු ධීවර අමාත්‍යාංශයේ සැලසුම් සහ අධීක්ෂණ අධ්‍යක්ෂවරයා;"

(2) ඒ උප වගන්තියේ (එ) සහ (ඒ) ඡේද ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන්:—

"(එ) පාරිසරික විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයකු;

(ඒ) 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත යටතේ පිහිටුවන ලද වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ-ජනරාල්වරයා;"; සහ

(3) ඒ වගන්තියේ (ඒ) ඡේදයට පසුව ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන්:—

(ඒඅ) 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා;

(ඒආ) ධීවර අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා (තාක්ෂණික);

(ඒඇ) 2009 අංක 41 දරන වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව පනත යටතේ පිහිටුවන ලද වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා;

(ඒඈ) (451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනත යටතේ පත්කළ වන සංරක්ෂක-ජනරාල්වරයා;

(ඒඉ) 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත යටතේ පත්කළ ගොවිජන සංවර්ධන කොමසාරිස්-ජනරාල්වරයා;

(ඒඊ) වාරිමාර්ග විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයකු;

(ඒඋ) වනජීවී සංරක්ෂණ විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයකු;

(ඒඌ) ගංගා නිම්න පිළිබඳ විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයකු;

(ඒඑ) ඉඩම් පිළිබඳ විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයකු;

(ඒඒ) සංචාරක කටයුතු පිළිබඳ විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයකු;

(ඒඔ) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමූපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද සීමාසහිත සමස්ත ලංකා මාදැල් හිමියන්ගේ ධීවර සමූපකාර සමිතියේ සභාපතිවරයා;

(ඒඕ) ජාතික ධීවර මහා සම්මේලනයේ සභාපතිවරයා;

(ඒක) ධීවර සංවිධානවල ජාතික ධීවර මහා සම්මේලනය විසින් නම් කරන ලද ධීවර කර්මාන්තයේ නිරතවන තැනැත්තන් දෙදෙනකු;

(ඒග) බහුදින ධීවර බෝට්ටු අයිතිකරුවන්ගේ සංගමය විසින් නම් කරන ලද ධීවර කර්මාන්තයේ නිරතවන තැනැත්තන් දෙදෙනකු;".

ප්‍රධාන ප්‍රඥප්තියේ II වන කොටසේ සඳහන් වන ශීර්ෂ පාඨය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ II වන කොටසේ සඳහන් වන ශීර්ෂ පාඨයේ "ධීවර මෙහෙයුම් සඳහා බලපත්‍ර දීම" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා ජල තීරය තුළ ධීවර මෙහෙයුම් සඳහා බලපත්‍ර දීම" යන වචන ආදේශ කිරීමෙන් ඒ පාඨය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ II වන කොටසට පසුව ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් කොටස මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ IIඅ කොටස ලෙස බලාත්මකව පැවතිය යුතු ය:—

ප්‍රධාන ප්‍රඥප්තියේ IIඅ අලුත් කොටස ඇතුළත් කිරීම.

"II අ කොටස

**මහ මුහුදේ ධීවර මෙහෙයුම් සඳහා බලපත්‍ර දීම**

මහ මුහුදේ ධීවර මෙහෙයුම් සඳහා බලපත්‍ර දීම.

14අ. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ප්‍රදානය කරන ලද බලපත්‍රයක අධිකාරී බලය යටතේ හැර සහ එහි නියමයන් සහ කොන්දේසිවලට අනුකූල නොවන ලෙස අන්‍යාකාරයකින් කිසිදු තැනැත්තකු විසින් මහ මුහුදේ නියමිත ධීවර මෙහෙයුම්වල නිරත නොවිය යුතු ය.

බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීම.

14ආ. (1) 14අ වගන්තිය යටතේ බලපත්‍රයක් සඳහා කරන සෑම ඉල්ලීමක් ම නියමිත ආකෘති පත්‍රයක් මගින් අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, (2) වන උපවගන්තියේ සඳහන් කරන ලද ප්‍රකාශය සහ නියමිත ගාස්තු සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (අ) (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලුම්පත්‍රයක්, මහ මුහුදේ මසුන් ඇල්ලීමට වෙනත් රටකින් බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් තමා වෙත නිකුත් කර ඇති බවට හෝ තමා වෙත නිකුත් කර නැති බවට ප්‍රකාශ කරමින් ඉල්ලුම්කරු විසින් අත්සන් කරන ලද ප්‍රකාශයක්, දිවුරුමක් සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) විවෘත මුහුදේ මසුන් ඇල්ලීමට වෙනත් රටකින් බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් තමා වෙත නිකුත් කර ඇති බවට ඉල්ලුම්කරු විසින් ප්‍රකාශ කරන්නේ නම්, ඔහු විසින්—

(i) ඒ බලපත්‍රය හෝ අවසර පත්‍රය නිකුත් කර ඇති රටේ නම සහ එය නිකුත් කළ දිනය;

(ii) ඒ බලපත්‍රය හෝ අවසර පත්‍රය පසුව අත්හිටවනු ලැබ ඇති අවස්ථාවක දී, එය අත්හිටවනු ලැබූ දිනය සහ එසේ අත්හිටවන ලද කාල සීමාව; සහ

(iii) ඒ බලපත්‍රය හෝ අවසරපත්‍රය පසුව අවලංගු කරනු ලැබ ඇත්නම් එසේ අවලංගු කරනු ලැබූ දිනය ද,

ප්‍රකාශයට පත්කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලුම්පත්‍රයක් ලැබුන පසුව (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් බලපත්‍රයක් ප්‍රදානය කිරීම හෝ තමා විසින් වාර්තා කරනු ලැබිය යුතු හේතු මත බලපත්‍රයක් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම කළ යුතු ය.

(4) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්-

(අ) ඉල්ලුම්පත්‍රයේ සඳහන් වන දේශීය ධීවර බෝට්ටුව මේ පනත යටතේ සාදන ලද නියෝගවලින් නිශ්චය කරනු ලැබූ පිරිවිතරවලට අනුකූලව තනා නොමැති නම්;

(ආ) ඒ බෝට්ටුව මේ පනත යටතේ ලියාපදිංචි කර නොමැති නම්;

(ඇ) ඒ බෝට්ටුව ඒකාකාරව සහ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් යාත්‍රා සලකුණු තැබීමේ ක්‍රමයට අනුකූලව සලකුණු තබා නොමැති නම්;

(ඈ) ඒ බෝට්ටුවේ ගෙනයන මසුන් ඇල්ලීමේ ධීවර ආම්පන්න, ආම්පන්නවල අයිතිකරු හඳුනාගැනීමට හැකිකරවමින් ඒකාකාරව

සහ ජාත්‍යන්තරව පිළිගත් ආම්පන්න සලකුණු තැබීමේ ක්‍රමයට අනුකූලව සලකුණු තබා නොමැති නම්;

(ඉ) අධ්‍යක්ෂ-ජනරාල්වරයාට සහ ඔහුගේ කාර්ය මණ්ඩලයට ඒ බෝට්ටුව සමඟ කාර්යක්ෂමව සන්නිවේදනය කිරීමට සහ ඒ බෝට්ටුවේ කටයුතු පිළිබඳ පාලනයේ යෙදීමට හැකිකරවමින් ඒ බෝට්ටුව යාත්‍රා අධීක්ෂණ පද්ධතියකින් සහ සන්නිවේදන උපකරණවලින් සම්පාදනය කර නොමැති නම්;

(ඊ) ඒ බෝට්ටුව මේ පනත යටතේ සාදන ලද නියෝගවලින් නිශ්චය කරනු ලැබූ ආරක්ෂිත උපකරණවලින් සම්පාදනය කර නොමැති නම්;

(උ) ඉල්ලුම්කරුට වෙනත් රටකින් නිකුත් කළ බලපත්‍රයකින් හෝ අවසර පත්‍රයකින් මහ මුහුදේ මසුන් ඇල්ලීම සඳහා ඒ බෝට්ටුව භාවිත කිරීමට බලය දෙනු ලැබ ඇත්නම්-

(i) ඒ බලපත්‍රය හෝ අවසර පත්‍රය යම් කාලසීමාවක් සඳහා අත්හිටවනු ලැබ ඇත්නම්; සහ

(ii) අත්හිටුවීමේ කාලසීමාව තවමත් බලාත්මකව ඇත්නම්; හෝ

(iii) ඒ බලපත්‍රය හෝ අවසර පත්‍රය අවලංගු කරනු ලැබ ඇත්නම්; සහ

(iv) ඒ අවලංගු කිරීමේ දින සිට වසර තුනක කාලසීමාවක් ගෙවී ගොස් නොමැති නම්,

(3) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කළ යුතු ය.

බලපත්‍රයේ ආකෘතිය සහ වලංගු කාලය.

14ඇ. මේ කොටස යටතේ ප්‍රදානය කරනු ලබන සෑම බලපත්‍රයක්ම-

(අ) නියමිත ආකෘතියට අනුකූල විය යුතු ය;

(ආ) කලින් අත්හිටවනු හෝ අවලංගු නොකරනු ලැබුවහොත් ඒ බලපත්‍රය ප්‍රදානය කරන ලද දින සිට එක් ලිත් වර්ෂයක කාල සීමාවකට වලංගු විය යුතු ය;

(ඇ) බලපත්‍රය අදාළ වන්නා වූ දේශීය ධීවර බෝට්ටු මෙහෙයුම් ප්‍රදේශය, අල්ලාගත් මසුන්, ඉවත් කරන ලද මසුන් සහ ඒ බෝට්ටුවේ ගොඩබෑම් සම්බන්ධයෙන් සෑම ධීවර ගමන් වාරයක් සඳහාම බලපත්‍රය දරන්නා විසින් සපයන තොරතුරුවලට අදාළවන කොන්දේසි ඇතුළුව ඒ බලපත්‍රයෙන් බලය දෙන ලද ධීවර මෙහෙයුම් සම්බන්ධයෙන් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් නියමයන් සහ කොන්දේසිවලට යටත් විය යුතු ය.

බලපත්‍ර පිළිබඳ රෙජිස්ටරය.

14ඈ. (1) පනතේ මේ කොටස යටතේ ප්‍රදානය කරන ලද සියලු බලපත්‍ර පිළිබඳ රෙජිස්ටරයක් පවත්වාගෙන යාමට අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් කටයුතු සැලැස්විය යුතු ය. ඒ රෙජිස්ටරය ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් ද පවත්වාගෙන යා හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන යම් රෙජිස්ටරයකින් ලබාගත් සත්‍ය පිටපතක් හෝ උද්ධෘතයක් බවට අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ අත්සනින් සහතික කළ යුතු බවට අදහස් කරන පිටපතක් හෝ උද්ධෘතයක් අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ අත්සන හෝ නිලය ඔප්පු කිරීමකින් තොරව සාක්ෂිවල දී ආවේශ්‍ය කරගනු ලැබිය යුතු

අතර ඒ රෙජිස්ටරයේ අන්තර්ගතයන් සියලු කාර්යයන් සඳහා සහ සිවිල් හෝ අපරාධ යන සියලු නඩුකටයුතුවල දී බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

**බලපත්‍රය ධීවර බෝට්ටුවේ රැගෙන යා යුතු බව.**

14ඉ. මේ කොටස යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රයක් දරන්නකු විසින් ඒ බලපත්‍රය එය අදාළ වන දේශීය ධීවර බෝට්ටුව තුළ සියලු අවස්ථාවල දී රැගෙන යාමට කටයුතු සලස්වනු ලැබිය යුතු අතර නියමිත අයුරින් බලය පවරන ලද නිලධරයකු විසින් ඒ බලපත්‍රය පරීක්ෂා කිරීමට අපේක්ෂා කරන අවස්ථාවක දී ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**විදේශීය ජල තීරයේ මසුන් ඇල්ලීම තහනම් බව.**

14ඊ. මේ කොටස යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රයක් දරන්නකු විසින්, යම් රටක නීතියට අනුකූලව එසේ කිරීමට බලය දී ඇත්නම් මිස, වෙනත් රටක දේශීය අධිකරණ බල සීමාව තුළ පිහිටි ජලසීමාව තුළ ධීවර මෙහෙයුම් සඳහා ඒ බලපත්‍රය අදාළ වන්නා වූ දේශීය ධීවර බෝට්ටුව භාවිත කිරීම හෝ භාවිත කිරීමට සැලැස්වීම නොකළ යුතු ය.

**බලපත්‍රලාභියා සංරක්ෂණ සහ කළමනාකරණ පියවරවල්වලට අනුකූල විය යුතු බව.**

14උ. මහ මුහුදේ ධීවර මෙහෙයුම් සඳහා දේශීය ධීවර බෝට්ටුවක් භාවිත කිරීම සඳහා බලය දෙමින් මේ කොටස යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රයක් දරන්නකු විසින්,

(අ) 1982, දෙසැම්බර් 10 එක්සත් ජාතීන්ගේ සාගර නීති සම්මුතිය යටතේ;

(ආ) ඉන්දීය සාගර ටූනා කොමිෂන් සභාව විසින්;

(ඇ) 1995 මත්ස්‍ය තොග පිළිබඳ ගිවිසුම යටතේ; සහ

(ඈ) 2009 නීති විරෝධී වාර්තා නොවූ සහ අවධිමත් ධීවර කටයුතු වැළැක්වීමට, නතර කිරීමට සහ පිටුදැකීමට වරාය සහිත

රාජ්‍යයන්වල පියවර පිළිබඳ එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධාන (FAO) ගිවිසුම යටතේ,

පිළිගත් සහ ශ්‍රී ලංකාව බැඳී සිටින්නා වූ සංරක්ෂණ සහ කළමනාකරණ පියවරවල් ක්‍රියාත්මක කිරීමේ දී 61 (ත) වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග උල්ලංඝනය කරමින් ඒ බෝට්ටුව පාවිච්චි කිරීම හෝ පාවිච්චි කිරීමට සැලැස්වීම නොකළ යුතු ය.

බලපත්‍රය අලුත් කිරීම.

14උඉ. (1) මේ කොටස යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රයක් දරන්නකු විසින්, බලපත්‍රය කල් ඉකුත් වීමට දින තිහකට නොඅඩු කාලසීමාවක දී, බලපත්‍රය අලුත් කිරීම සඳහා අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත ඉල්ලුම් කරනු ලැබිය හැකි ය.

(2) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්-

(අ) බලපත්‍රය අදාළ වන්නා වූ දේශීය ධීවර බෝට්ටුව 14ආ(4) වගන්තියේ සඳහන් කරන ලද කොන්දේසිවලට අනුකූල වන පරිදි පවත්වාගෙන යන බවට;

(ආ) බලපත්‍ර දරන්නා විසින් ඒ බලපත්‍රයේ නියමයන් සහ කොන්දේසි පිළිපැද ඇති බවට;

(ඇ) බලපත්‍ර දරන්නා විසින් බලපත්‍රය අලුත් කිරීම සඳහා වන නියමිත ගාස්තු ගෙවා ඇති බවට; සහ

(ඈ) 14උ වගන්තියේ සඳහන් කරන ලද සහ 61 වන වගන්තිය යටතේ සාදන ලද නියෝගවලින් ක්‍රියාත්මක කරන ලද සංරක්ෂණ සහ කළමනාකරණ පියවරවල බලාත්මක භාවයට බලපත්‍රය අලුත් කිරීමෙන් හානියක් ඇති නොවන බවට,

සෑහීමට පත්වේ නම්, ඔහු විසින් බලපත්‍රය අලුත් කරනු ලැබිය යුතු ය.

බලපත්‍රය අත්හිටුවීම.

14එ. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, ඒ බලපත්‍ර දරන්නා 14ඊ වගන්තිය හෝ 14උ වගන්තිය උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් විමර්ශනයකට භාජනය වෙමින් සිටින බවට සෑහීමකට පත්වේ නම්, බලපත්‍ර දරන්නාට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දීමෙන් පසුව, මේ කොටස යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රයක් අත්හිටවනු ලැබිය යුතු ය. එවැනි යම් අත්හිටුවීමක් විමර්ශනයේ තීරණය ලැබෙන තෙක් බලාත්මකව පැවතිය යුතු ය.

බලපත්‍රය අවලංගු කිරීම.

14ඒ. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්-

(අ) බලපත්‍ර දරන්නා මේ පනත යටතේ වූ වරදක් සඳහා වරදකරු කරනු ලැබ ඇති බවට;

(ආ) බලපත්‍ර දරන්නා විසින් මේ පනතේ විධිවිධාන කිසිවක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ ඒ බලපත්‍රයේ යම් නියමයක් හෝ කොන්දේසියක් උල්ලංඝනය කර ඇති බවට;

(ඇ) බලපත්‍ර දරන්නා විසින් වෙනත් රටක දේශීය අධිකරණ බල සීමාව තුළ පිහිටි ජල තීරයේ බලය නොලත් ධීවර කටයුතු සඳහා හෝ වෙනත් රටක දේශීය අධිකරණ බල සීමාව තුළ පිහිටි ජල තීරයේ හෝ මහ මුහුදේ බලය නොලත් හෝ නීති විරෝධී කටයුතු සඳහා බලපත්‍රය අදාළ වන දේශීය ධීවර බෝට්ටුව භාවිත කර ඇති බවට;

(ඈ) බලපත්‍රය අදාළ වන ධීවර බෝට්ටුව දේශීය ධීවර බෝට්ටුවක් බවට පත්වීම අවසන් වී ඇති බවට; සහ

(ඉ) ධීවර බෝට්ටුවේ ලියාපදිංචිය අවලංගු වී ඇති බවට,

සෑහීමට පත් වී ඇත්නම්, ඔහු විසින් මේ කොටස යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රයක් අවලංගු කරනු ලැබිය යුතු ය.

අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ තීරණය ඒ සඳහා වන හේතු ද සමග දැනුම් දිය යුතු බව.

14. ඔ. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් බලපත්‍රක් ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කරන හෝ බලපත්‍රයක් අත්හිටුවීම හෝ අවලංගු කිරීම සිදු කරන අවස්ථාවක දී, ඔහු විසින් ඒ තීරණය සහ ඒ සඳහා වන හේතු අවස්ථාවෝචිත පරිදි ඉල්ලුම්කරුට හෝ බලපත්‍රලාභියාට දැනුම් දෙනු ලැබිය යුතු ය.

අභියාචනා.

14 ඕ. (1) 14 ඔ වගන්තිය යටතේ තමා වෙත දැනුම් දෙන ලද තීරණයෙන් අගතියට පත් අවස්ථාවෝචිත පරිදි ඉල්ලුම්කරු හෝ බලපත්‍රලාභියා විසින් ඒ තීරණයට එරෙහිව,ඒ තීරණය තමා වෙත දැනුම් දුන් දින සිට දින තිහක් ඇතුළත, ලිඛිතව අමාත්‍යාවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) (අ) ලේකම්වරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද සෑම අභියාචනයක්ම, අභියාචනය උපදේශක කමිටුව වෙත ඒ අභියාචනය පිළිබඳ එහි නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා යොමු කරනු ලැබිය යුතු ය.

(ආ) අභියාචන උපදේශක කමිටුව, ධීවර සහ ජලජ සම්පත් කළමනාකරණය සහ සංරක්ෂණය පිළිබඳ දැනුම සහ පළපුරුද්ද ඇති තැනැත්තන් අතරින් ලේකම්වරයා විසින් පත්කළ තැනැත්තන් තුන්දෙනෙකුගෙන් සමන්විත විය යුතු ය.

(ඇ) අභියාචන උපදේශක කමිටුව විසින් දෙපාර්ශවයටම සවන් දීමෙන් පසුව (අ) ඡේදය යටතේ එයට යොමු කරන ලද අභියාචනයක් පිළිබඳ

එහි නිර්දේශ ඒ යොමු කිරීමෙන් දින දහතරක් ඇතුළත ඉදිරිපත් කළ යුතු ය.

(3) ලේකම්වරයා විසින්, අභියාචන උපදේශක කමිටුවේ නිර්දේශ සැලකිල්ලට ගෙන (1) වන උපවගන්තිය යටතේ ඔහු වෙත ඉදිරිපත් කරන අභියාචනයක් නිශ්චය කරනු ලැබිය යුතු අතර,

(අ) අභියාචනයකට අවසර දීම සහ බලපත්‍රය ප්‍රදානය කිරීමට හෝ අලුත් කිරීමට හෝ බලපත්‍රය අත්හිටුවීම හෝ අවලංගු කිරීම ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමට අධ්‍යක්ෂ-ජනරාල්වරයාට නියෝග කිරීම ; හෝ

(ආ) හේතු දැක්වීමක් සහිතව අභියාචනයට අවසර නොදීම යන,

දෙයාකාරයෙන් එක් ආකාරයකට කටයුතු කරනු ලැබිය හැකි ය.

(4) ලේකම්වරයා විසින් (3) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත නිකුත් කරන යම් නියෝගයකට අනුකූලව ඔහු විසින් කටයුතු කරනු ලැබිය යුතු ය.

(5) බලපත්‍රයක් සඳහා හෝ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් ප්‍රතික්ෂේප කරන විට අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අවස්ථාවෝචිත පරිදි ඉල්ලුම්කරුට හෝ බලපත්‍රලාභියාට ඒ ඉල්ලුම්පත්‍රය සමග යොමු කරන ලද ගාස්තු ආපසු ගෙවිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ ලේකම්වරයාගේ තීරණය අවසාන සහ තීරණාත්මක විය යුතු ය.

**බලපත්‍රය පැවරීම.**

14 ක. (1) අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ එකඟත්වය ඇතිව මිස මේ කොටස යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රයක් පවරනු නොලැබිය යුතු අතර එම පැවරීම පිළිබඳ බලපත්‍රයේ පිටසන් කරනු ලැබිය

යුතු ය. බලපත්‍රයක් පවරනු ලබන අවස්ථාවක, බලපත්‍රය පවරනු ලබන්නාගේ නමට ධීවර බෝට්ටුවේ ලියාපදිංචිය ද පවරනු ලැබිය යුතු ය.

(2) 14 ඒ වගන්තිය යටතේ බලපත්‍රය අවලංගු කරනු ලැබ ඇති තැනැත්තකුට ඔහුගේ නමින් බලපත්‍රයක් පවරා ගැනීමට හිමිකම් නොතිබිය යුතු ය.

ධීවරයන් සඳහා වන අධ්‍යාපනික වැඩසටහන් .

14ග. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, මේ පනත යටතේ සාදන ලද නියෝග පිළිබඳව සහ ඉන්දීය සාගර ටූනා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද නිර්ණායක පිළිබඳ ධීවරයන්ට උපදෙස් දීම සඳහා ද; මාලු තොග සංරක්ෂණය කිරීමට සහ පරිසර දූෂණය අවම කිරීමට රජය විසින් ගන්නා ලද පියවරවල් පිළිබඳ ධීවරයන් අතර දැනුවත් බවක් ඇති කිරීම සඳහා ද ; පවතින සම්පත්වලට යටත්ව, දීර්ඝකාලීන අධ්‍යාපනික සහ පුහුණු කිරීමේ වැඩ සටහන් පැවැත්විය යුතු ය.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "ශ්‍රී ලංකා ජල තීරයේ " යන වචන වෙනුවට "ශ්‍රී ලංකා ජල තීරයේ හෝ මහ මුහුදේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** 16 වන වගන්තියට පසුව ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 16 අ සහ 16 ආ වගන්ති ලෙස පිළිවෙලින් බලාත්මකව පැවතිය යුතු ය:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 අ සහ 16 ආ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

ධීවර මෙහෙයුම් සඳහා වන ධීවර බෝට්ටු ලියාපදිංචි කිරීම සහ ධීවර මෙහෙයුම්වල නිරතවීම සඳහා නිකුත්කළ බලපත්‍ර අවලංගු කිරීම හෝ අත්හිටුවීම.

16 අ. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් වෙනත් රටක අධිකරණ බලප්‍රදේශය තුළ පිහිටි ජලතීරයේ නීතිවිරෝධී ධීවර මෙහෙයුම් කරගෙ යාමට යම් තැනැත්තකු සම්බන්ධ වී සිටින බවට සහ ඒ මෙහෙයුම් සඳහා භාවිත කළ ධීවර බෝට්ටුව 15 වන වගන්තිය යටතේ ලියාපදිංචි කළ දේශීය ධීවර බෝට්ටුවක් බවට විශ්වාස කිරීමට ඔහුට සාධාරණ හේතු ඇති අවස්ථාවක දී ඒ තැනැත්තාට හෝ අයිතිකරුට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබාදීමෙන් පසුව-

(අ) 15 වන වගන්තිය යටතේ දේශීය ධීවර බෝට්ටුවක් ලෙස ඒ බෝට්ටුව ලියාපදිංචි කිරීම ඔහු විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් කාල සීමාවක් සඳහා අවලංගු කිරීම හෝ අත්හිටුවීම; සහ

(ආ) අවස්ථාවෝචිත පරිදි (6) වන වගන්තිය හෝ 14 අ වගන්තිය යටතේ, අවස්ථාවෝචිත පරිදි බලපත්‍රලාභියකුට ශ්‍රී ලංකා ජල තීරයේ හෝ මහ මුහුදේ නියම කරන ලද ධීවර මෙහෙයුම්වල නිරත වීමට බලය පවරමින් ධීවර බෝට්ටුවකට නිකුත් කරන ලද යම් බලපත්‍රයක් අවලංගු කිරීම හෝ අත්හිටුවීම.

අයිතිකරුගේ දැනුම්දීම මත අවලංගු කිරීම.

16 ආ. ලියාපදිංචි ධීවර බෝට්ටුවක අයිතිකරුවකු විසින්, නිශ්චිතව සඳහන් කරන ලද දිනයෙන් පසුව, ශ්‍රී ලංකා ජල තීරයේ හෝ මහ මුහුදේ ධීවර කාර්යයන් සඳහා එම ධීවර බෝට්ටුව භාවිත කිරීමට ඔහු අදහස් නොකරන බැවින්, ඔහුගේ නමින් ලියාපංදිචි කර ඇති ධීවර බෝට්ටුවේ ලියාපදිංචිය අවලංගු කරන ලෙසට ලිඛිතව අධ්‍යක්ෂ-ජනරාල්වරයාගෙන් ඉල්ලා සිටින අවස්ථාවක දී, ශ්‍රී ලංකා ජල තීරයේ හෝ මහ මුහුදේ ධීවර කාර්යයන් සඳහා ඒ ධීවර බෝට්ටුව භාවිත නොකරන බවට වූ කරුණු පිළිබඳ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සෑහීමකට පත්වීමෙන් පසුව, ඔහු විසින් ඒ ධීවර බෝට්ටුවේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබිය යුතු ය. ඒ අවලංගු කිරීම ඔහු විසින් නිශ්චිතව සඳහන් කරන දිනයක සිට බලාත්මක විය යුතු ය. ඔහු විසින් ලියවිල්ලකින් අවලංගු කිරීම පිළිබඳ කරුණු අයිතිකරු වෙත දැනුම් දීම ද සිදු කළ යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම .

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ "ශ්‍රී ලංකා ජල තීරයේ" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා ජලතීරයේ හෝ මහ මුහුදේ " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ.

"ධීවර කළමනාකරණ ප්‍රදේශ.

31. (1) යම් ප්‍රදේශයක ධීවරයන් විසින්, ශ්‍රී ලංකා ජල තීරයේ හෝ ඒ ජල තීරය හා ඊට යාබද ගොඩබිම යන දෙකටම අයත්, නියමිත ප්‍රදේශයක්, මේ පනතේ කාර්යයන් සඳහා ධීවර කළමනාකරණ ප්‍රදේශයක් වශයෙන් නම් කරන ලෙසට ලිඛිතව අධ්‍යක්ෂ-ජනරාල්වරයාගෙන් ඉල්ලා සිටිය හැකි ය.

(2) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්-

(අ) ඔහුගේ යෝජනාවක් මගින්; හෝ

(ආ) (1) වන උපවගන්තිය යටතේ ලියවිල්ලකින් ඔහු වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් අනුව,

ශ්‍රී ලංකා ජල තීරයේ හෝ ඒ ජල තීරය හා ඊට යාබද ගොඩබිම යන දෙකටම අයත්, නියමිත ප්‍රදේශයක්, ධීවර කාලමනාකරණ ප්‍රදේශයක් ලෙස නම් කිරීමට අමාත්‍යවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් යම් ප්‍රදේශයක මත්ස්‍ය සහ වෙනත් ජලජ සම්පත්වල පැවැත්මට තර්ජනයක් පවතින බවට වන අවස්ථානුගත කරුණුවල ගෝචරභාවයක් පවතින්නේ ද යන්න පිළිබඳ වූ යම් පරීක්ෂා කිරීම් සහ විමර්ශනවලින් පසුව තමා සෑහීමට පත්වන්නේ නම් පමණක් එවැනි නිර්දේශයක් සිදුකරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ නිර්දේශයක් ලැබුනු පසු ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින්, මේ පනතේ කාර්යයන්

සඳහා ධීවර කළමනාකරණ ප්‍රදේශයක් ලෙස නිර්දේශයේ සඳහන් කරන ලද ප්‍රදේශය නම් කරනු ලැබිය හැකි ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 අ වගන්තිය සහ 31 ආ වගන්තිය ඇතුළත් කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියට පසුව ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්ති ඒ ප්‍රඥප්තියේ 31අ සහ 31ආ වගන්ති ලෙස බලාත්මකව පැවතිය යුතු ය.

"ධීවර කළමනාකරණ සහ-සහභාගීත්ව කමිටු.

31අ. (1) 31 වන වගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් නම් කරන ලද සෑම ධීවර කළමනාකරණ ප්‍රදේශයක් සඳහා ම අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් පත්කරන ලද (මෙහි මින් මතු “සහ-සහභාගීත්ව කමිටුව” යනුවෙන් සඳහන් කරනු ලබන) ධීවර කළමනාකරණ සහ-සහභාගීත්ව කමිටුවක් පැවතිය යුතු ය.

(2) සහ-සහභාගීත්ව කමිටුව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සහ-සහභාගීත්ව කමිටුව විසින් තීරණය කරනු ලැබිය යුතු කාරණය සැලකිල්ලට ගෙන පහත සඳහන් නිලධරයන් අතුරින් සංස්ථාපනය කළ යුතු ය:—

(අ) දිස්ත්‍රික් ධීවර කාර්යාලය භාර නිලධරයා සහ ඒ කාර්යාලයෙන් වෙනත් නිලධරයන් දෙදෙනකු;

(ආ) (i) ඒ ධීවර කළමනාකරණ ප්‍රදේශය සඳහා පිහිටුවන ලද ධීවර කමිටුවේ සාමාජිකයන් අතරින් තෝරා පත්කරගත් තැනැත්තන් හතර දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක්; හෝ

(ii) ඒ ධීවර කළමනාකරණ ප්‍රදේශය තුළ ධීවර කමිටු දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් පවතින අවස්ථාවක දී, ඒ ධීවර කළමනාකරණ ප්‍රදේශ තුළ තිබෙන සියලු ධීවර කමිටුවල සාමාජිකයන් විසින් තෝරා පත්කරගත් තැනැත්තන් දොළොස් දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින්:

එසේ වුව ද ඒ එක් එක් ධීවර කමිටුවෙන් සාමාජිකයින් සමාන සංඛ්‍යාවක් සිටිය යුතු ය;

(iii) පවතින ධීවර කළමනාකරණ අධිකාරිවල සියලු සාමාජිකයන්;

(ඈ) ධීවර කළමනාකරණ ප්‍රදේශය පිහිටා ඇති පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයා;

(ඇ) ධීවර කළමනාකරණ ප්‍රදේශය පිහිටා ඇති පරිපාලන දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම්වරයා;

(ඉ) ධීවර කළමනාකරණ ප්‍රදේශය පිහිටා ඇති ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සංස්ථාපනය කර ඇති ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා;

(ඊ) ධීවර කළමනාකරණ ප්‍රදේශය පිහිටා ඇති මහ නගර සභා සීමාව සඳහා සංස්ථාපනය කර ඇති මහ නගර සභාවේ නගරාධිපතිවරයාගෙන් හෝ ධීවර කළමනාකරණ ප්‍රදේශය පිහිටා ඇති නගර සභා සීමාව සඳහා පිහිටුවා ඇති නගර සභාවේ සභාපතිවරයා;

(උ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ පිහිටුවන ලද අධිකාරියේ නාගරික සංවර්ධන සභාපතිවරයා විසින් නම් කරන ලද, ඒ අධිකාරියේ නිලධරයකු;

(ඍ) ධීවර කළමනාකරණ ප්‍රදේශය පිහිටුවා ඇති පළාතේ පළාත්බද ධීවර අධ්‍යක්ෂවරයා;

(එ) 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ පනත යටතේ පිහිටුවන ලද, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නම් කරන ලද වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිලධරයකු;

(ඒ) 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජ්‍යායතන පනත යටතේ පිහිටුවන ලද, ජාතික ජලජ සම්පත් පර්යේෂන හා සංවර්ධන නියෝජ්‍යායතනයේ පාලක මණ්ඩලයේ සභාපතිවරයා විසින් නම් කරන ලද, ජාතික ජලජ සම්පත් ඒ නිලධරයකු;

(ඔ) 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද, ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා විසින් නම් කරන ලද, ඒ අධිකාරියේ නිලධරයකු;

(ඕ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ පිහිටුන ලද, මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිවරයා විසින් නම් කරන ලද ඒ අධිකාරියේ නිලධරයකු;

(ක) (469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ පිහිටුවන ලද වන ජීවී සංරක්ෂක දෙපාර්තමේන්තුවේ වනජීවී සංරක්ෂක අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නම් කරන ලද ඒ දෙපාර්තමේන්තුවේ නිලධරයකු;

(ග) (451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනත යටතේ පිහිටුවන ලද, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වන සංරක්ෂක ජනරාල්වරයා විසින් නම් කරන ලද ඒ දෙපාර්තමේන්තුවේ නිලධරයකු;

(ඞ) 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ පිහිටුවන ලද, සමුද්‍රීය පරිසර ආරක්ෂක අධිකාරියේ සභාපතිවරයා විසින් නම් කරන ලද ඒ අධිකාරියේ නිලධරයකු;

(ජ) ඉඩම් පිළිබඳ විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරන ලද ඉඩම් අමාත්‍යාංශයේ නිලධරයකු;

(ට) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත මගින් පිහිටුවන ලද, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විසින් නම් කරන ලද ඒ අධිකාරියේ නිලධරයකු;

(ඩ) ධීවර කළමනාකරණ ප්‍රදේශය පිහිටා ඇති පළාත සඳහා නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් නම් කරන ලද පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධරයකු;

(ණ) 2009 අංක 41 දරන වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව පනත මගින් පිහිටුවන ලද වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නම් කරන ලද ඒ දෙපාර්තමේන්තුවේ නිලධරයකු ;

(ත) ධීවර කළමනාකරණ ප්‍රදේශය පිහිටා ඇති පළාත සඳහා නාවික ආඥාපති විසින් නම් කරන ලද ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධරයකු.

(3) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සහ-සහභාගීත්ව කමිටුවේ ලේකම්වරයා හෝ කැඳවුම්කරු (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ දක්වා ඇති නිලධරයන් අතුරින් පත් කළ යුතු ය. ලේකම්වරයා හෝ කැඳවුම්කරු විසින් ධීවර කළමනාකරණ ප්‍රදේශය සඳහා සංස්ථාපනය කර ඇති සහ-සහභාගීත්ව කමිටුවේ සියලු රැස්වීම් කැඳවනු ලැබිය යුතු ය.

(4) ධීවර කළමනාකරණ ප්‍රදේශයක් සඳහා සංස්ථාපනය කර ඇති සහ-සහභාගීත්ව කමිටු යටත් පිරිසයින් සෑම මසකට වරක් හෝ හදිසි අවස්ථාවක් සම්බන්ධයෙන් වූ කාරණාවක දී රැස්විය යුතු ය.

(5) අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ ඔහුගේ නාමිකයකු විසින් සහ-සහභාගීත්ව කමිටුවේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය. සහ-සහභාගීත්ව කමිටුවේ රැස්වීමක් සඳහා අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ ඔහුගේ නාමිකයකු පැමිණ නොමැති අවස්ථාවක දී, පැමිණ සිටින සාමාජිකයන් විසින්, ඔවුන් අතරින් ඒ රැස්වීම සඳහා සභාපතිවරයකු තෝරාපත් කරගනු ලැබිය හැකි ය.

(6) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, ප්‍රාදේශීය සහ-සහභාගීත්ව කමිටු අනුයෝජිතයන්, ධීවර කළමනාකරණ ප්‍රදේශ සීමාව තුළ පවත්වාගෙන යනු ලබන වෙනත් වාණිජ කටයුතු නියෝජනය කරන සමාගම්වල අනුයෝජිතයන්, ධීවර කාන්තා කණ්ඩායම්වල අනුයෝජිතයන්, සහ කළමනාකරණ ප්‍රදේශ සීමාව තුළ ස්වාභාවික සම්පත් කළමනාකරණය සහ ධීවරයින්ගේ සුබසාධන කටයුතුවලට සම්බන්ධ රාජ්‍ය නොවන සංවිධානවල අනුයෝජිතයන් ඇතුළුව සහ-සහභාගීත්ව කමිටුවේ සාමාජිකයන් ලෙස වෙනත් තැනැත්තන් පත් කරනු ලැබිය හැකිය.

ධීවර සංවර්ධන සහ කළමනාකරණ සැලසුම්.

31ආ. (1) ධීවර කළමනාකරණ ප්‍රදේශයක් සඳහා සංස්ථාපනය කරන ලද සහ-සහභාගීත්ව කමිටුව විසින්, ඒ ප්‍රදේශය ධීවර කළමනාකරණ ප්‍රදේශයක් ලෙස නම් කරමින් 31 (3) වන වගන්තිය යටතේ නියමය සිදුකළ දින සිට වසර එකක කාල සීමාවක්

ඇතුළත ධීවර කළමනාකරණ ප්‍රදේශය සම්බන්ධයෙන් ධීවර සංවර්ධන සහ කළමනාකරණ සැලසුමක් අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත භාරදීම එහි කාර්යය විය යුතු ය.

(2) සහ-සහභාගීත්ව කමිටුවක් විසින් සකස් කළ ධීවර සංවර්ධන සහ කළමනාකරණ සැලසුමක පහත දැක්වෙන යෝජනා කිසිවක් හෝ ඒ සියල්ල ඇතුළත් කරනු ලැබිය යුතු ය:-

(අ) විශේෂිත භාවිතයන් සඳහා කලාපවලට ධීවර කළමනාකරණ ප්‍රදේශය බෙදීම සඳහා වූ යෝජනා;

(ආ) ධීවර කළමනාකරණ ප්‍රදේශය තුළ මසුන් සහ ජලජ සම්පත් අල්ලා ගැනීම සඳහා විශේෂිත ආකාරයේ ධීවර ආම්පන්න සහ උපකරණ භාවිතය තහනම් කිරීම සඳහා හෝ ඒ පිළිබඳ නියාමනය කිරීම සම්බන්ධයෙන් වන යෝජනා;

(ඇ) ධීවර කළමනාකරණ ප්‍රදේශ තුළ මසුන් හෝ ජලජ සම්පත් ඇල්ලීම සඳහා විශේෂ ක්‍රම භාවිත කිරීම තහනම් කිරීම සඳහා හෝ ඒ සම්බන්ධයෙන් නියාමනය කිරීම සඳහා වන යෝජනා;

(ඈ) ධීවර කළමනාකරණ ප්‍රදේශ තුළ විශේෂිත මත්ස්‍ය විශේෂයන් හෝ ජලජ සම්පත් ඇල්ලීම තහනම් කිරීම සඳහා වන යෝජනා;

(ඉ) ධීවර කළමනාකරණ ප්‍රදේශවල විශේෂිත කොටස්වල ධීවර කටයුතු සඳහා හෝ ඒ ධීවර කළමනාකරණ ප්‍රදේශ තුළ විශේෂිත මත්ස්‍ය විශේෂයන් සඳහා තහනම් කාල සීමා ප්‍රකාශයට පත්කිරීමේ යෝජනා;

(ඊ) ධීවර කළමනාකරණ ප්‍රදේශය තුළ මසුන් හෝ ජලජ සම්පත් රැගෙන යා හැකි වේලාවන් විධිමත් කිරීම සඳහා වූ යෝජනා;

(උ) ධීවර කළමනාකරණ ප්‍රදේශ තුළ ඇති ස්වභාව සෞන්දර්යාත්මක පිහිටීම් හෝ සංස්කෘතික හෝ පාරිසරික විශේෂත්වය සංරක්ෂණය කිරීම සඳහා වූ යෝජනා;

(ඎ) ධීවර කළමනාකරණ ප්‍රදේශය තුළ මසුන් සහ අනිකුත් ජලජ සම්පත්වල පාරිසරික සමතුලිතතාවය වැඩිදියුණු කිරීම සඳහා වූ යෝජනා;

(එ) ධීවර කළමනාකාර ප්‍රදේශවලට අදාළ පර්යේෂණවලට, පසු-අස්වනුවලට සහ අලෙවි කිරීමේ සහ සංවර්ධන අංශවලට යොමු කිරීමේ යෝජනා;

(ඒ) අධීක්ෂණය, අනුකූලවීම සහ සුපරීක්ෂාකාරී බව සඳහා වූ යෝජනා; සහ

(ඔ) උපදේශනය සහ සමාලෝචනය සඳහා වූ යෝජනා.

(3) සහ-සහභාගීත්ව කමිටුව විසින් ධීවර සංවර්ධන සහ කළමනාකරණ සැලසුම අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත භාර දී දින හැටක් ඇතුළත අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් මේ පනතේ අරමුණු පිළිබඳ සැලකිල්ලට ගෙන ඒ සැලසුමේ වෙනස්කම් කිසිවක් ඇත්නම් ඒවා සිදුකර ඒ සැලසුම අමාත්‍යවරයාගේ අනුමතය සඳහා භාරදිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ භාරදෙන ලද සැලසුමක්, අමාත්‍යවරයා විසින්, එය ඔහු වෙත භාරදීමේ දින සිට දින හැටක් ඇතුළත අනුමත කරනු ලැබිය යුතු අතර ඒ සැලසුම ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු සැලැස්විය යුතු ය. ඒ සැලසුම ගැසට් පත්‍රයේ එය පළ කරනු ලැබූ දින සිට හෝ එහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි යම් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(5) 61 වන වගන්තිය යටතේ සුදුසු නියෝග සෑදීමෙන් සහ 34 වන වගන්තිය යටතේ සුදුසු නිවේදන පළකිරීම මගින් සැලසුමේ විධිවිධානවලට අමාත්‍යවරයා විසින් බලාත්මක භාවයක් ලබාදිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

11 ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කර ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් :-

"(1) මේ පනතේ 14ඉ, 15, 16, 17 හෝ 22 වන වගන්තිවල විධිවිධාන හෝ 30 වන වගන්තිය යටතේ සාදන ලද යම් නියමයක් උල්ලංඝනය කරන හෝ ඒවාට අනුකූලවීම පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් විසිපන් දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(2) මේ පනතේ 6 වන, 28 වන, 34 වන හෝ 35 වන වගන්තිවල විධිවිධානවලට අනුකූලවීම උල්ලංඝනය කරන හෝ පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් විසිපන් දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.".

(2) (2) වන උපවගන්තියට පසුව ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් :-

"(2අ) 14අ හෝ 14ඊ වගන්තිවල විධිවිධානවලට අනුකූලවීම උල්ලංඝනය කරන හෝ පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා වන

බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ පහළොවකට අඩු නොවන දඩයකට යටත් විය යුතු ය.”.

(2ආ) මේ පනතේ 29 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලවීම උල්ලංඝනය කරන හෝ පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.".

(3) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "රුපියල් එක් දහසකට අඩු නොවන දඩයකට" යන වචන වෙනුවට "රුපියල් විසිපන් දහසකට නොවැඩි දඩයකට" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(5) 61 (ත) වගන්තිය යටතේ සාදන ලද නියෝගයක් නොවන මේ පනත යටතේ සාදන ලද නියෝගයක් උල්ලංඝනය කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් විසිපන් දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

එසේ වුව ද,

(අ) හැඹිලි දැල්වලින් මසුන් ඇල්ලීම ;

(ආ) පිටත බිත්තර රැගෙන යන කටු පොකිරිස්සන් හෝ පිටත බිත්තර සහිත සපත්තු පොකිරිස්සන් මිලදී ගැනීම, විකිණීම, ප්‍රවාහනය හෝ සන්තකයේ තබා ගැනීම ; හෝ

(ඇ) කටු පොකිරිස්සන්ගේ හෝ සපත්තු පොකිරිස්සන්ගේ බිත්තර ඉවත් කිරීම,

තහනම් කිරීමේ නියෝගයක් උල්ලංඝනය කිරීමට සම්බන්ධවන වරදක් සඳහා වරදකරු කිරීම සම්බන්ධයෙන් වූ කාරණාවක දී දඩය රුපියල් පනස් දහසකට නොවැඩි දඩයක් විය යුතු ය.".

(5) (5) වන උප වගන්තියට පසුව ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :-

"(6) මේ පවතේ 61 (ත) වගන්තිය යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.".

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (ඔ) ඡේදයට පසුව ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(ඔඔ) අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද සහ 31ආ (4) වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරන ලද සංවර්ධන සහ කළමනාකරණ සැලසුමේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම.".

(2) ඒ උපවගන්තියේ (ණ) වන ඡේදයට පසුව ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන්:—

"(ණඅ) පුහුණු කිරීම් සඳහා දේශීය ධීවර බෝට්ටුවල නියමුවන් තෝරාගැනීමේ දී පිළිගත යුතු නිර්ණායක;

(ණආ) දේශීය ධීවර බෝට්ටුවල නියමුවන්ට දක්ෂතා පිළිබඳ සහතික නිකුත් කිරීම සඳහා යෝජනා ක්‍රමයක් සහ දේශීය ධීවර බෝට්ටුවල නියමුවන් පුහුණු කිරීමේ දී අනුගමනය කළ යුතු විෂය නිර්දේශය සකස් කිරීම;

(ණඇ) මත්ස්‍ය අභිජනන ජෛව ප්‍රජාව ආරක්ෂා කිරීම;

(ණඈ) කාර්මික සහ ගෘහස්තිත අපද්‍රව්‍ය ශ්‍රී ලංකා ජල තීරයට බැහැර කිරීම වැලැක්වීම සහ ශ්‍රී ලංකා ජල තීරයේ මසුන් සහ ජලජ සම්පත්වලට හානියක් සිදුවන ආකාරයෙන් එම ජල තීරය ගොඩකිරීම වැලැක්වීම;

(ණඉ) මසුන් ඇල්ලීමේ විනෝදජනක ක්‍රීඩා සඳහා භාවිත කරන බෝට්ටු ලියාපදිංචි කිරීම සහ මසුන් ඇල්ලීමේ විනෝදජනක ක්‍රීඩා සඳහා බලපත්‍ර නිකුත් කිරීම;

(ණඊ) ධීවර මෙහෙයුම් සඳහා භාවිත කරන ධීවර ආම්පන්න, උපකරණ සහ එංජින් ආනයනය කිරීම, නිෂ්පාදනය කිරීම සහ විකිණීම තහනම් කිරීම සහ ඒ පිළිබඳ නියෝග සෑදීම;

(ණඋ) දේශීය ධීවර බෝට්ටුවල සවිකිරීමට සහ පවත්වාගෙන යාමට අවශ්‍ය කරන අධීක්ෂණය සහ සෝදිසි කිරීම් සඳහා වූ තාක්ෂණික උපකරණ;

(ණඌ) ඇතුළත එංජින් සවිකරන ලද දේශීය ධීවර බෝට්ටුවල සවිකිරීමට අවශ්‍යකරන ට්‍රාන්ස්පොන්ඩර;

(ණඑ) ජාතික ධීවර මහා සම්මේලනය සහ දිස්ත්‍රික් සහ ගම් මට්ටමින් ධීවර සංවිධාන පිහිටුවීම; සහ

(ත) (i) 1982, දෙසැම්බර් 10 එක්සත් ජාතීන්ගේ සාගර නීති සම්මුතිය යටතේ;

(ii) ඉන්දීය සාගර ටූනා කොමිෂන් සභාව විසින්;

(iii) 1995 මත්ස්‍ය තොග පිළිබඳ ගිවිසුම යටතේ;

(iv) 2009 නීතිවිරෝධී, වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර කටයුතු වැලැක්වීමට, නතර කිරීමට සහ පිටුදැකීමට වරාය සහිත රාජ්‍යයයන්වල පියවර පිළිබඳ එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO),

මගින් ඇතිකරගත් ගිවිසුම් සම්බන්ධයෙන් කළමනාකරණ සහ සංරක්ෂණ පියවර ගැනීම.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "ජලජීවී වගාව" යන යෙදුමේ අර්ථ නිරූපණයට පෙරාතුව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීම මගින් :-

' "2009 නීතිවිරෝධී, වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර කටයුතු වැලැක්වීමට, නතර කිරීමට සහ පිටුදැකීමට වරාය තුළ වූ රජයේ පියවරවල් පිළිබඳ ගිවිසුම" යන්නෙන්, වරාය තුළ වූ රජයේ පියවරවල් බලාත්මකව ක්‍රියාත්මක කිරීම මාර්ගයෙන් නීතිවිරෝධී, වාර්තා නොවූ සහ අවිධිමත් (IUU) ධීවර කටයුතු වැලැක්වීමට, නතර කිරීමට සහ පිටු දැකීමට සහ ඒ මගින් ජීවී මුහුදු සම්පත් සහ මුහුදු ජීවී ප්‍රජාව දීර්ඝකාලීනව සංරක්ෂණය කිරීම සහ පාරිසරික සමතුලිතතාව ආරක්ෂා වෙන පරිදි භාවිතය තහවුරු කිරීම සඳහා 2009 නොවැම්බර් මස 22 වන දින රෝමයේ දී අත්සන් කරන ලද ගිවිසුම අදහස් වේ;';

(2) "බලයලත් නිලධරයා" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීම මගින්:-

' "සංරක්ෂණ සහ කළමනාකරණ පියවර" යන්නෙන් ජීවී, මුහුදු සම්පත් විශේෂයෙන් එකක් හෝ කීපයක් සංරක්ෂණය කිරීමට හෝ කළමනාකරණය කිරීමට ගන්නා ලද පියවර අදහස් වේ;';

(3) "ධීවර මෙහෙයුම" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීම මගින්:-

' "1995 මත්ස්‍ය තොග පිළිබඳ ගිවිසුම "යන්නෙන්, පිහිටුවා තිබෙන මාළු තොග සහ බොහෝ සේ සංක්‍රමික වන මාළු තොග සංරක්ෂණය සහ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් 1982, දෙසැම්බර් මස 10 එක්සත් ජාතීන්ගේ සාගර නීති සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා 1995 දෙසැම්බර් මස 04 වන දින නිව්යෝර්ක් නගරයේ දී අත්සන් කරන ලද ගිවිසුම අදහස් වේ;';

(4) "විදේශීය ධීවර බෝට්ටුව" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීම මගින් :-

' "මහ මුහුද'' යන්නෙන්, ශ්‍රී ලංකා ජලතීරයෙන් පිටත වූ ජල තීරය හෝ වෙනත් යම් රටක දේශීය අධිකරණ බලසීමාව තුළ ජලතීරයෙන් පිටත වූ ජල තීරය අදහස් වේ;';

(5) "ආනයනය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීම මගින් :-

' "ඉන්දියන් සාගර ටූනා කොමිෂන් සභාව'' යන්නෙන් 1993 නොවැම්බර් මස 25 වන දින රෝමයේ අහාර හා කෘෂිකර්ම සංවිධානයේ (FAO) මණ්ඩලය විසින් පිළිගත් ඉන්දීය සාගර ටූනා කොමිෂන් සභාව පිහිටුවීම සඳහා ගිවිසුමකින් පිහිටුවන ලද ඉන්දීය සාගර ටූනා කොමිෂන් සභාව අදහස් වේ ;'; සහ

(6) ''ශ්‍රී ලංකා ජල තීරය'' යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීම මගින් :-

' "1982, දෙසැම්බර් 10 එක්සත් ජාතීන්ගේ සාගර නීති සම්මුතිය'' යන්නෙන්, 1982 දෙසැම්බර් මස 10 වන දින ජැමෙයිකාවේ මොන්ටෙගෝ බේ හි දී අත්සන් කරන ලද සාගර නීති සම්මුතිය අදහස් වේ.'.

''ධීවරයා'' යන වචනය ආදේශ කිරීමෙන්.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන කිසිවක "ධීවරයා" යන වචනය යෙදෙන සෑම අවස්ථාවක දී ම ඒ වෙනුවට "ධීවරයා" යන වචනය ආදේශ කරනු ලැබ තිබිය යුතු ය.

අන්තර්කාලීන විධිවිධාන.

**16.** මේ පනත ආරම්භවන දිනයට පෙරාතුව ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය යටතේ නම් කරන ලද සෑම ධීවර කළමනාකරණ ප්‍රදේශයක්ම, මේ පනතේ 9 වන වගන්තිය මගින් සංශෝධිත පරිදි ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය යටතේ නම් කරන ලද ධීවර කළමනාකරණ ප්‍රදේශයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව මේ පනත ආරම්භ වන දිනයෙන් මාස තුනක කාලසීමාවක් ඇතුළත ඒ ධීවර කළමනාකරණ ප්‍රදේශ සඳහා ධීවර සහ-සහභාගීත්ව කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු ය. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය යටතේ පිහිටුවා ඇති යම් ධීවර කළමනාකරණ අධිකාරියක් මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයේ සිට වලංගුව පැවතීම අවසන් විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**17.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.